# 21 මල් ගොමුවක අසිරිය

සැලසුම් සහගත ව ජීවිතය ගත කරන අය විවේක කාලය වුව ද ඉබේ ගෙවී යාමට ඉඩ නො හරිති. විවේක කාලය යනු නිදා ගැනීමට පමණක් වෙන් වූ කාලයක් හෝ නිකරුණේ ගෙවා දැමෙන කාලයක් හෝ නො වේ. වඩාත් ඵලදායි ලෙස ගත කළ යුතු කාලයකි. විවේක ගැනීම නම් සාමාන්‍යයෙන් දෛනික ව යෙදී සිටින කාර්යයෙන් බැහැර වීමයි. ජීවිතයේ ඒකාකාර බවින් මිදී කිසියම් වින්දනයක් ලැබීමට විවේක කාලය යොදා ගැනීම සාමාන්‍ය ස්වභාවයයි.

විවේක කාලය ගත කිරීමේ ක්‍රියාකාරකම් පුද්ගල රුචිකත්වය අනුව වෙනස් බව අපි දනිමු. ඇතැම්හු ක්‍රීඩා කරති. ඇතැම් අය පොත පත කියවීමෙහි හා ලේඛනයෙහි යෙදෙති. තවත් සමහරු නැටීම්, ගැයීම්, වැයීම් වැනි සෞන්දර්ය ක්‍රියාකාරකම්වල යෙදෙති. ගුවන් විදුලියට සවන් දෙන්නන් මෙන් ම රූපවාහිනිය නරඹන්නෝ ද වෙති. ඒ අතර එළවළු පලතුරු හා ඖෂධ පැළ වවන්නන් මෙන් ම විසිතුරු පැළ හා මල් වවන්නෝ ද වෙති. මේවා අතරින් මෙම පාඩමේ දී අවධානය යොමු කෙරෙන්නේ මල් වගාව කෙරෙහි ය.

මල් වැවීමෙන් අපේක්ෂා කෙරෙන ප්‍රධාන ම දෙය නම් සුන්දර පරිසරයක් ගොඩ නගා ගැනීමයි. නිවසක් ඉදිරිපස අඳුරු බවත් අවිධිමත් බවක් නැති ව රමණීයත්වයක් තිබිය යුතු ය. එය නිවැසියන්ට මෙන් ම නිවසට පැමිණෙන්නන්ට ද සුවදායී මානසික වින්දනයක් ලබා ගැනීමට හේතු වෙයි. මානසික පීඩා, චෛතසික අවුල් ලිහිල් වී තැන්පත් බවක් ඇති වීමට සුන්දර පරිසරය බලපායි. පාරිසරික සුන්දරත්වය භාවනාවෙහි යෙදෙන්නකුට පවා හිතකර වූවකි. සිදුහත් බෝසතාණන් වහන්සේ භාවනාව සඳහා උරුවේලාව තෝරා ගැනීමේ දී එහි පාරිසරික සුන්දරත්වය ගැන ද සැලකිලිමත් වූ බව පෙනේ.

> "රමණීයෝ වත භූමිභාගෝ, පාසාදිකෝ ච වනසණ්ඩෝ
> නදී ච සන්දති සේතකා සුපතිත්ථා රමණීයා
> සමන්තා ච ගොචරගාමො, අලං වතිදං කුලපුත්තස්ස
> පධානත්ථිකස්ස පධානාය."

භූමි භාගය රමණීයයි. වන ලැහැබ ප්‍රසාද ජනක ය. සුදු වැලි තලා ඇති මනා තොටු පොළ ඇති සිත්කලු නදිය ද ගලා බසින්නීය. හාත්පස සොඳුරු ගම ද වෙයි. ප්‍රධන් කරනු කැමති කුළ පුත්‍රයකුට ප්‍රධන් වීර්යය සඳහා මෙම භූමි භාගය සුදුසු ම ය.

(අරියපරියෙසන සූත්‍රය)



සෑම නිවසක් ඉදිරිපස මෙන් ම නිවසට පිවිසෙන මඟ දෙපස මල් ගොමු වෙත් නම් මුළු ගම ම සුන්දර වනු ඇත. එබඳු ගම්මානවලින් සැදුණු රට ද සුන්දර වේ. ඒ අනුව මල් වගා කර තම නිවාස අවට අලංකාර කරන තැනැත්තා මුළු රටේ ම සෞන්දර්යය ඇති කිරීමට දායක වන්නෙකි.

අලුයමින් අවදි වී ගෙමිදුලට පිවිසෙන විට ම නෙත ගැටෙන්නේ විවිධ මල්වලින් බර වූ මල් ගොමුවක් නම් එයින් අපේ ගත සිත දෙක ම ප්‍රබෝධයට පත් වේ. මල් සුවඳ පිස ගෙන හමන සිසිල් සුළඟ ගත සිත සනසාලයි. මල් පැණි බීමට පැමිණෙන සමනලුන් අත්තටු සලමින් මලින් මලට යන විටත්, මලක් මත මලක් තැබුවාක් මෙන් මල් පැණි බොන විටත් ඇත්තේ අමුතු ම සුන්දරත්වයකි. රොන් ගැනීමට පැමිණෙන බඹරුන්ගේ සහ මී මැස්සන්ගේ ගුමු ගුමු නාදයත් කුරුලු කෙවිල්ලන්ගේ සුමිහිරි ගීත රාවයත් අපේ දෙසවන ට නිරාමිස සතුටක් ලබා දෙයි. ඇස සනසන, කන පිනවන, සිත ගත පොබයන මල් ගොමුවක් අපේ නිවස ඉදිරිපස ඇති කර ගැනීම සඳහා විවේක කාලයෙන් බිඳක් වෙන් කර ගන්නේ නම්, මල් වගාව සිය විනෝදාංශය කර ගැනීමට හැකි නම් මොන තරම් අගනේ ද?

ගෙවත්තෙහි හා මිදුලෙහි හොඳට ඉඩකඩ ඇති තැනෙක සැලසුම් සහගත ව කලාත්මක මල් ගොමුවක් ඇති කර ගත හැකි ය. සීමිත භූමි භාගයක

වුව ද පෝච්චි භාවිත කරමින් මල් මැසි ඉදිකරමින් මල් පැල වගා කර ගත හැකි ය. මල් වගාවෙන් ගෙමිදුලට සුන්දරත්වයක් එකතු කළ හැක්කේ එය ක්‍රමානුකූල ව කළ හොත් පමණකි. එක ම මල් වර්ගයක් වැවීමට වඩා වර්ණයෙන් ගන්ධයෙන් හැඩයෙන් විවිධත්වයක් ඇති විවිධ මල් වර්ග තම මල් ගොමුවට එකතු කර ගත හොත් එය කීප අතකින් ම වැදගත් වනු ඇත.


ඇතැම් මල් වැල්වල හා මල් ගස්වල සැමදාට ම මල් පිපෙන අතර ඇතැම් මල් පිපෙන්නේ එක්තරා කාල සීමාවක් තුළ ය. ඇතැම් සුවඳැති මල් වැඩි දිනක් නො පවතී. ඉක්මනින් ම පරවී යයි. සුවඳ නැති එහෙත් වර්ණවත් දිගු කලක් පරනොවී පවතින මල් වර්ග ද ඇත. දිගු කලක් නො පැවතිය ද සුගන්ධය හා සුන්දරත්වය සලකා වගා කළ යුතු මල් ඇත. සුවඳින් තොර වුව ද කාලසීමාවක් නැතුව හැමදාට ම මල් පිපෙන ගස් වැල් වර්ග ද අප තෝරා ගත යුත්තේ සුවඳ නැතත් අලංකාරය ගෙන දෙන බැවිනි.

ඇතැම් ප්‍රදේශවලට ගිය විට දක්නට ලැබෙන ලස්සන මල්වලින් පැළයක් අපේ ගෙවත්තේ ද රෝපණය කර ගත හොත් හොඳ යයි සිතේ. ආපසු එන විට අන් සියල්ලට ම වඩා සැලකිල්ලෙන් රැගෙන එන්නේ එම මල් පැළයයි. රෝපණය කරන ලද එම මල් පැළය එක්කෝ නො වැඩේ. නැතහොත් එහි නිසි පරිදි මල් හට නො ගනී. එයින් අප තේරුම් ගත යුත්තේ සමහර ප්‍රදේශවල සරුවට වැවෙන මල් වර්ග තවත් සමහර ප්‍රදේශවල නො වැඩෙන බවයි. සීත කලාපයෙහි සරුවට වැවෙන මල් වර්ග වියළි කලාපයෙහි වගාකර ගැනීම අපහසු වේ. එබැවින් තම ප්‍රදේශයට ගැළපෙන මල් වර්ග තෝරා ගැනීම කෙරෙහි ද අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. සමහර මල් පිපෙන්නේ සූර්යාලෝකය හොඳින් ලැබුනහොත් පමණකි. දැඩි හිරු රැස්වලට නිරාවරණය නො විය යුතු ය. සෙවණෙහි වගා කළ යුතු මල් ද ඇති බව අපි දනිමු. මල් වගාවේ දී එබඳු කරුණු ගැන ද සැලකිලිමත් වීම අවශ්‍ය ය.

මල් වගාවක් සාර්ථක වීමට නම් සැලසුම් සහගත සාත්තු කිරීමක් තිබිය යුතු ය.

- නිසි කලට පොහොර යෙදීම
- වතුර දැමීම
- පස බුරුල් කිරීම
- තණකොළ ගැලවීම
- අතු කප්පාදු කිරීම
- වැල්වලට අවශ්‍ය ආධාරක සැපයීම

ආදිය නිසි පරිදි විය යුතු ය. රසායනික පොහොර යොදන්නේ නම් ගස්වැල්වල වර්ධනයට අවශ්‍ය පොහොර මෙන් ම මල් හට ගැනීමට අවශ්‍ය පොහොර ද භාවිත කළ යුතු වෙයි.



ස්වභාවික පරිසරයෙන් සපයා ගනු ලබන හා සකස් කර ගනු ලබන ගොම පොහොර, කොළ පොහොර ආදියට ගස් වැල් හුරු කර ගත හොත් රසායනික පොහොර සඳහා දරන වියදම ඉතිරි කර ගත හැකි වේ. මේ සඳහා උපදෙස් අපේ වැඩිහිටියන්ගෙන්, පාසලේ කෘෂිකර්ම ගුරුතුමාගෙන් මෙන් ම ප්‍රදේශයේ කෘෂිකර්ම සංවර්ධන කටයුතුවලට අදාළ නිලධාරීන්ගෙන් ද ලබා ගත හැකි වේ.

මල් ගොමුව පාරිසරික සෞන්දර්යය ඇති කරන්නක් පමණක් නො වේ. ආර්ථික වටිනාකමක් ද ඇත්තකි. මල් වගාව කිරීමේ දී පැළ සහ මල් අලෙවියෙන් ආදායමක් ලබා ගත හැකි වර්ග ද තෝරා ගැනීමට අප සැලකිලිමත් විය යුත්තේ එබැවිනි. දරුවන් හැටියට මල් වැවීමේ දී ආර්ථික වාසිවලටත් වඩා ලබාගත හැකි වෙනත් ප්‍රයෝජන ගැන සැලකිලිමත් වීම වැදගත් වේ. පහත සඳහන් වන්නේ එබඳු ප්‍රයෝජන කිහිපයකි.

- බුද්ධ පූජාවට බෝධි පූජාවට අවශ්‍ය මල් නෙළා ගැනීම
- නිවසේ ආලින්දය මල්වලින් සැරසීම
- මල් අවශ්‍ය අයට නොමිලයේ මල් නෙළා ගැනීමට සලසා පින් සිදු කර ගැනීම
- මල් ගොමුවෙහි පැණි උරන සතුන් දෙස බලා සතුටක් ලැබීම
- මල් පැණිවලින් ජීවත් වන සතුන්ට ආයාසයකින් තොර ව ආහාරයක් සපයා පින් සිදු කර ගැනීමට හැකි වීම
- මල් සහ මල් පැල පරිත්‍යාග කිරීමෙන් නිරාමිස සතුටක් ලබා ගැනීමට හැකි වීම
- විවිධ මල් වර්ග හඳුනා ගැනීමට මෙන් ම අන්‍යයන්ට හඳුන්වා දීමට ද හැකි වීම
- වඳ වී යන මල් වර්ග ආරක්ෂා කර ගැනීමට දායක වීම
- හැමදා ම පින් වැඩෙන උතුම් කාර්යයක නිරත වෙමැයි නිරාමිස වින්දනයක් ලැබීම
- විවේක කාලය ඵලදායි ලෙස ගත කරන ලදැයි ආත්ම තෘප්තියක් ලැබීමට හැකි වීම

මීට අමතර ව මල් දෙස බලා අපට ඉගෙන ගත හැකි තවත් බොහෝ දේ ඇත. පැණි බීමට පැමිණෙන කුරුල්ලන්ටත් රොන් ගැනීමට ළඟාවන මී මැස්සන්ටත් මල් ගොමුව සලකන්නේ සමාන ආකාරයෙනි. මල් පැණි, මල් රොන්, මල විසින් නිෂ්පාදනය කරනු ලැබ ඇත්තේ පරාර්ථය පිණිස හෙවත් අනුන්ට උපකාර පිණිස ම ය. සාමානාත්මතාව සහ පරාර්ථචර්යාව පිළිබඳ පාඩම මල විසින් අපට උගන්වනු ලබන්නේ ඒ ආකාරයෙනි.

බුද්ධ පූජාව සඳහා අප මල් නෙළා ගන්නේ අපේ ම මල් ගොමුවෙනි. ඒවා අතර වර්ණයෙන් විවිධ වූ, සුගන්ධයෙන් විවිධ වූ, ප්‍රමාණයෙන් විවිධ වූ, වර්ගයෙන් විවිධ වූ මල් ඇත. ඒ සියලු මල් පන්සලට යන්නේ එක ම මල් භාජනයකිනි. සමාජයේ තිබෙන කිසිදු භේදයක් පන්සලට නැත. එහෙයින් උස් මිටි භේද නො සලකා එක් උසස් අරමුණක් වෙනුවෙන් අපි එක ම මඟක යමුයි මල් යෝජනා කරන්නාක් මෙනි.

තව ද අප මල් පූජා කරන විට සිතට නගා ගන්නේ ද උතුම් අදහසකි.

"පූජේමි බුද්ධං කුසුමේනනේන<br>
පුඤ්ඤේනමේතේන ලභාමි මොක්ඛං,<br>
පුප්ඵං මිලායාති යථා ඉදං මේ<br>
කායෝ තථා යාති විනාසභාවං."

මේ මලින් මුනිඳුන් - පුදමි මොක්සුව පතමින්<br>
මල පර ව යන මෙන් - මගෙ කය ද වැනසේ ය සැබවින්

මෙබඳු උතුම් පාඩම් කියාදෙන මල් සැලකිල්ලෙන් වගා කිරීමට කුඩා කල සිට ම පුරුදුවීම වැදගත් ය. එම මල්වලට සාත්තු කිරීමට ද අවශ්‍ය ය. ඒ සඳහා නියමිත වැඩ පිළිවෙළක් තිබිය යුතු ය. කෘමිනාශක යෙදීමට වඩා අවශ්‍ය වන්නේ මල්වලට හානිකරන කෘමීන් බෝ වීම වළක්වා ගැනීමයි. මල්වලට සාත්තු කිරීමේ දී ඒ පිළිබඳ ව සැලකිලිමත් වීම අවශ්‍ය ය.

බුද්ධ පූජාවට වුව ද මල් නෙළාගත යුත්තේ මල් ගහේ හෝ මල් ගොමුවේ සුන්දරත්වයට හානියක් නොවන පරිදි ය. සම්පූර්ණ අත්තක් හෝ සම්පූර්ණ ගසක් හෝ පාළුවන ආකාරයට මල් නෙළා ගැනීම නො කළ යුතු ය. මල්

ගොමුවේ තැනින් තැනින් නෙළා ගන්නේ නම් සුන්දරත්වයට හානියක් නො වේ. අපේ පැරැන්නන් ගසේ තිබිය දී ම මල් පූජා කළේ මෙම පාරිසරික සුන්දරත්වය ද සැලකිල්ලට ගැනීමෙන් විය යුතු ය.

**කුසුමං ඵුල්ලිතං ඒතං**
**පග්ගහෙත්වාන අඤ්ජලිං,**
**බුද්ධසෙට්ඨං සරිත්වාන**
**ආකාසෙමපි පූජයෙ.**

මෙසේ ගසේ තිබිය දී මල් පූජා කිරීමට පුරුදු වූයේ ඇතැම් විට අතු අග පිපි මල් නෙලා ගැනීමේ දුෂ්කරතාව නිසා වීමට ද ඉඩ ඇත. එසේ වුව ද එම ක්‍රමය පාරිසරික සෞන්දර්යය ආරක්ෂා වීමට ද අනුබලයක් වන බව පෙනේ.

**මල පිවිතුරු බවේ සංකේතයකි.**

**අපි අපේ ජීවිතයේ ද පිවිතුරු බව මතු කර ගනිමු.**

### සාරාංශය

- මල් වැවීම විනෝදාංශය කර ගැනීමෙන් විවේක කාලය ඵලදායක ලෙස ගත කිරීමේ අවස්ථාව ලැබේ.
- විවිධ වර්ගයේ මල් වැවීම වඩාත් ඵලදායක ය.
- මල් වැවීමෙන් ගෙමිදුල, ගෙවත්ත, ගම, රට අලංකාර වේ.
- ආර්ථික භෝගයක් ලෙස ද මල් වගා කළ හැකි ය.
- සුන්දර මල් ගොමුව ගත සිත සනසයි.
- මල් වගාව හැමදා ම පින් වැඩෙන පින්කමකි.
- තම ප්‍රදේශයට උචිත මල් තෝරාගෙන වගා කළ යුතු ය.
- හොඳ මල් අස්වැන්නක් ලබාගත හැක්කේ හොඳින් සාත්තු කළහොත් පමණකි.
- මල නිහඬ ව අපට කියාදෙන බණ රැසක් ඇත.

පිවිතුරු සුන්දරත්වය, ගුණ සුවඳින් යුතු බව, ක්‍රමවත් බව එහි එක් පැත්තකි. අනිත්‍ය බව, ජීවිතයේ යථාර්ථය අනෙක් පැත්තයි.

පුහුණුවට

යථාපි පුප්ඵරාසිම්හා
කයිරා මාලා ගුණේ බහු,
ඒවං ජාතේන මච්චේන
කත්තබ්බං කුසලං බහුං.

(ධම්මපදය-පුප්ඵවග්ග)

මල් රැසකින් මනා
මල්දම් ගොතන ලෙසිනා
පින්කම් කළ මනා
උපන් හැම මිනිසකු ම විසිනා

**ක්‍රියාකාරකම**

1. මල් වගාවෙන් ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න.
2. පාරිසරික සෞන්දර්යය ආරක්ෂා කර ගැනීමට ඔබ ද දායක විය යුතු යයි සිතන්නේ කවර හෙයින් දැයි පැහැදිලි කරන්න.
3. 'මලක් කථා කරයි' යන මාතෘකාවෙන් උපදේශ පහක් ලියන්න.

**පැවරුම**

ගෙමිදුලේ මල් වගාවක් ආරම්භ කර එහි ප්‍රගතිය පිළිබඳ ව සතිපතා සටහන් තබා ගුරුතුමාට පෙන්වන්න.